# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක: 13 /2014

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07

2014 නොවැම්බර් මස 21 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>පරිපාලනමය නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවන ලද අන්තර් දීමනාවේ හිඟ මුදල් ගෙවීම</u>

අමාත්‍ය මණ්ඩල අනු කමිටුව හා අන්තර් විශ්වවිද්‍යාල වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව අතර 2004.09.23 වන දින අත්සන් කිරීමට යෙදුනු ගිවිසුම ප්‍රකාරව දීමනාවක් ගෙවීම සම්බන්ධයෙන් 2004.10.22 දින නිකුත් කර ඇති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 850 හා ඉහත සඳහන් කාර්ය මණ්ඩලයට අන්තර් දීමනාවක් ගෙවීම සම්බන්ධයෙන් වූ 2005.03.01 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 857 හා 2007.05.11 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 888 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

2. 2014.09.30 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ශීර්ෂගත කරුණ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමට පත්කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවේ නිර්දේශය සැලකිල්ලට බඳුන් කරමින් එම කාර්ය මණ්ඩලයට ගෙවිය යුතුව ඇති අන්තර් දීමනාවේ හිඟ මුදල් ගෙවීමට අනුමැතිය ලබා දී ඇත.

3. ඒ අනුව කොමිෂන් සභා චක්‍රලේඛ අංක 857 හි සඳහන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණයන් පදනම් කර ගනිමින් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 888 මගින් 2007 වර්ෂයේ දී අන්තර් දීමනාව ගෙවා ඇති අදාල සේවකයින්ට එම දීමනාවේ හිඟ මුදල ගෙවීමට උසස් අධ්‍යාපන ආයතනවලට මෙයින් උපදෙස් දෙනු ලැබේ. මේ වන විට විශ්‍රාමික/ඉල්ලා අස්වූ/මියගිය එකී සේවකයින් ද ඒ අනුව මෙම දීමනාව ලැබීමට හිමිකම් ලබයි. එක් එක් සේවක කාණ්ඩයට අදාලව ගෙවිය යුතු හිඟ මුදල් ප්‍රමාණයන් එවකට (2004 වර්ෂයේ දී) පැවති වැටුප් කේතයන්ට අනුව අමුණා ඇති ලේඛනයේ **(ඇමුණුම)** 4 වන තීරුවෙහි දක්වා ඇත.

4. මෙම ගෙවීම විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, විශ්‍රාම අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගණනය කිරීමේ දී හා අතිකාල, ණය, විශ්‍රාම පාරිතෝෂිකය වැනි වෙනත් ගෙවීම් සඳහා අදාල කර නොගත යුතුය.

5. මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලැබේ. එබැවින් අදාල සේවකයින්ට මෙම දීමනාව ගෙවීමට උසස් අධ්‍යාපන ආයතන වෙත දැනුම් දෙනු ලැබේ.

6. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ, මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත් :
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. මූල්‍යාධිකාරිවරුන්
10. උසස් අධ්‍යාපන ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෝ.ස.පුස්තකාලයාධිපතිවරුන්/ ස. පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෝ.ස.ලේඛකාධිකාරිවරුන්/ ස.ලේඛකාධිකාරිවරුන්
12. උසස් අධ්‍යාපන ආයතන/ මණ්ඩපවල ජ්‍යෝ.ස.මූල්‍යාධිකාරිවරුන්/ ස.මූල්‍යාධිකාරිවරුන්
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෝ.ස.අභ්‍යා.විගණකවරුන්/ ස.අභ්‍යා.විගණකවරුන්
16. වෘත්තීය සමිති ලේකම්වරුන්
17. විගණකාධිපති.

ගොනු අංකය : යූජීසී/එච්ආර්/2/9/86
T/-

ඇමුණුම

<u>පරිපාලනමය නොවන අනධ්‍යයන කාර්ය මණ්ඩලයට 2004 වර්ෂයට හිමි හිඟ වැටුප් ගෙවීම</u>

| 1 | 2 | 3 | 4 | | |
|---|---|---|---|---|---|
| අනු අංක | අදාල සේවක කාණ්ඩයන්ට නියමිත වැටුප් කේතයන් | කොමිෂන් සභා චක්‍රලේඛ අංක **857** ට අනුව මුළු මුදල (රු.) | අදාල එක් එක් සේවකයාට ගෙවිය යුතු මුදල | | |
| | | | අදාලවන කාල සීමාව | ගෙවිය යුතු ප්‍රතිශතය | මුදල |
| 1 | A-04(a) | 23,400 | 2004 ජනවාරි සිට 2004 දෙසැම්බර් දක්වා | 50% | **11,700** |
| 2 | A-04(c) | 19,200 | | 50% | **9,600** |
| 3 | A-04(d) | 19,200 | | 50% | **9,600** |
| 4 | A-05 | 28,200 | | 50% | **14,100** |
| 5 | A-05(a) | 28,200 | | 50% | **14,100** |
| 6 | A-06 | 24,360 | | 50% | **12,180** |
| 7 | A-06(a) | 24,420 | | 50% | **12,210** |
| 8 | A-07 | 24,420 | | 50% | **12,210** |
| 9 | A-08 | 23,880 | | 50% | **11,940** |
| 10 | A-09 | 18,900 | | 50% | **9,450** |
| 11 | A-10 | 22,080 | | 50% | **11,040** |
| 12 | A-11 | 20,820 | | 50% | **10,410** |
| 13 | A-12 | 19,800 | 2004 ජනවාරි සිට 2004 අගෝස්තු දක්වා | 47.88% | **9,480** |
| 14 | A-13 | 19,320 | | 33.33% | **6,440** |
| 15 | A-14 | 14,040 | | 33.33% | **4,680** |
| 16 | A-15 | 20,760 | | 33.33% | **6,920** |